සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

දැරණියගල කොට්ඨාශය

10 ශ්‍රේණිය - නර්තනය - 2 වාරය

කාර්ය පත්‍රිකාව

## ජීවන වෘත්තියක් නර්තන නිර්මාණයෙන් ඔපවත් කරමු

පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි දක්නට ලැබෙන ජනප්‍රිය ජීවන වෘත්තීන් කීපයකි

- පතල් කර්මාන්තය
- මැටි කර්මාන්තය
- කෘෂි කර්මාන්තය
- ධීවර කර්මාන්තය
- කොහු කර්මාන්තය
- තේ කර්මාන්තය

ක්‍රියාකාරකම 01

- ඉහත වෘත්තීන්ගෙන් ඔබ කැමති වෘත්තියක් තෝරා ගන්න.
- එම කර්මාන්තයේ ස්වභාවය අනුව ඊට අදාළ ක්‍රියාකාරකම් අනුපිළිවෙලට පෙළගස්වන්න.
- ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු චලන කීපයක් නිර්මාණය කරන්න.

ක්‍රියාකාරකම 02.

- අන්තර්ජාල පහසුකම් ඇත්නම් ඔබ තෝරාගත් තේමාව ඇසුරින් නිර්මාණය කර ඇති නර්තන අංග කීපයක් නරඹන්න.
- එහි චලන නිර්මාණයකර ඇති ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න
- ඔබ විසින් නිර්මාණය කරන ලද චලන සමග, අන්තර්ජාලයෙන් නැරඹූ නර්තනයේ චලන සමග සසඳා අවශ්‍යා පරිදි චලන නැවත සකස් කර ගන්න.
- එවැනි පහසුකම් නොමැති වුවත්, ඔබ විසින් නිර්මාණය කරන ලද චලන සුදුසු පරිදි යොදා ගනිමින් නර්තනයේ යෙදෙන්න.
- අවශ්‍යා පරිදි ගායනා සහ සරල කස්තිරම් කොටස් ඇතුළත්කර ගනිමින් අලංකාරවත් ලෙස නිමාවක් ඇති නර්තන අංගයක් නිර්මාණය කරන්න.
- එය හොඳින් පුහුණු වන්න.

ටී.ඒ. කේ.ගුණසේකර

නර්තන ගුරු උපදේශක